## කවි කොළය

### බලු - මිනිස් කතාවක්!

පෙර කෙබරස් තුමා බේගල් පායෙහි විසුව
හවසට හීන් අඩියක් ගැසුවට පසුව
බල්ලා සමග කළ රසවත් කසු කුසුව
මිතුරෙකු එවා ඇත එය රහසින් ඇසුව

"හව් ආ යූ මගේ බලු සුරතල් කොල්ලෝ
කෝමද දැන් පවුල් කන්නේ ඔය ගොල්ලෝ"
"ඇලිමනි නොයිල්ලති පාරේ බලු කෙල්ලෝ
ජොලියේ සිටිති කවදත් අප වැනි බල්ලෝ"

"බලු මස්සිනේ උඹ පසුවන මුත් ජොලියේ
සැපතක් නොමැත මේ දෙස්පාලන කෙළියේ"
"නිරුවත රටට පෙන්වනු ඇයි කල එළියේ
අපි ජොලි කරමු දිය රත්වන තුරු සැලියේ"

"පානුත් ගිනි ගණන් හැත්තෑවයි හාල
ජනතා කෝපයේ නැග එයි ගිනි බෝල"
"ඔබ ළඟ සිටින තෙක් වරදිනු නැත වේල
ඇම් පී කෙනෙකු වාගෙයි මේ බලු රාළ"

"තෙල් මිළ තෙලෙහි ලූ පපඩම පරිදි පිපේ
මහජනතාව කබලේ සිට වැටුණි ලිපේ"
"බෙන්සෙක ලැබූ දෙන්නා පන්සලක අපේ
උසුලනු නොහී සෝකෙන් මහපොළවෙ හැපේ"

"අල්ලස් කොමිසමෙන් ඇති කළ මුත් බාදා
ඉල්ලම් දෙක තුනක් මම ගත්තෙමි පාදා"
"පැරදි අසුන හොම්බෙන් ගෙදරට ආදා
බිස්නස් කරමු අපි ඉල්ලම් ටික සෝදා"


"ඉන්නේ කෙලෙසකද මේ දුක හිතේ දරන්
හීනෙන් බෙල්ල මිරිකනවා පබා කරන්"
"සාකච්ජා මගින් ඔය යෝදයා අරන්
අගමැති පුටුව දෙමු ගණනක් කතා කරන්"

"බලු වැඩ කෙරුව බව ජන්දෙදි නැගණ හිර
බත්ගොටිටෝ කියති යූ ඇන් පියට බර"
"මහ බොරුවක්ය! ඔය බලු වැඩ කරන පොර
ලෙඩ ඇඳ උඩය සිටියේ අත් වකුටු කර"

"මට ඇස් රුදා දෙයි
පත්තර කන් තෝරු
ඔලුගෙඩි පලම්
අල්ලා රවකයො තීරු"
"ඔබගෙයි මගෙයි
නම්දෙක කරගෙන මාරු
කෙරුවොත් හොඳයි
ඒවැනි වැඩ තක තීරු"



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**





පොදුරාජ්‍ය මණ්ඩලීය සමුළුවට සහභාගිවීම සඳහා ලන්ඩනයට පැමිණ සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 9 වෙනි දා බ්‍රිතාන්‍ය අගමැති ගෝඩ්න් බ්‍රවුන් මහතා අංක 10 ඩවුනිං වීදියේ අගමැති නිල නිවසේ දී හමු වූ අවස්ථාවයි මේ.

## දෙහිවල බෝම්බයට සම්බන්ධ සිංහල පොලිස් කොස්තාපල් දැලේ

**දෙ**හිවල පිපුරුණු බෝම්බය ඇටවූ බාලසුබ්‍රමනියම්ගේ ගෝලයා වූ නිශාන්තන් නමැති ද්‍රවිඩයා සමග කිට්ටු ඇසුරක් පැවැත්වූ දෙහිවල පොලීසියේ සිංහල කොස්තාපල්වරයෙකු අපරාධ විමර්ශන අංශය මගින් අත් අඩංගුවට ගෙන ඇත. මේ පොලිස් නිලධාරියා එම නිශාන්තන් සමග මෝටර් සයිකලයකින් නිතර ගමන් බිමන් ගොස් ඇත. එම යතුරු පැදිය නිශාන්තන්ට අයත් එකකි. ඔහු නිවාඩු දමා මිතුරෙකු සමග කීපවතාවක්ම බැංකොක් ගිය බවත් එළිවී ඇත. බෝම්බය පිපුරුණු පසු නිශාන්තන් පොලීසියට බාර විය දෙහිවල බෝම්බය සහ කොළඹ බෝම්බ රැසක් ඇටවූ මහ මොළකාරයා බාලසුබ්‍රමනියම් ඉරට්ටපෙරියකුලම් හිදී අල්ලාගත්තේය.

## 'අපි වෙනුවෙන් අපි' අරමුදල ලන්ඩනයේ ඇරඹේ

**ගි**ය මාසයේ ලන්ඩනයේ ශ්‍රීලංකා මහ කොමසාරිස් කාර්‍යාලයේ දී ශ්‍රීලංකාවේ රණවිරුවන් වෙනුවෙන් දියත් කළ **අපි වෙනුවෙන් අපි** නම් අරමුදල උත්සවා කාරයෙන් ආරම්භ විය. විශ්‍රාම ලත් යුදහමුදා මේජර්වරයෙකු වන දැන් ලන්ඩනයේ පදිංචිව සිටින එන්. එල්. සී. පෙරේරා මහතා විසින් අරමුදලට මුල පුරන ලොතරැයියේ මුල්ම ටිකට් පොත මහකොමසාරිස්තුමිය වන කෂ්ණුකා සෙනෙවිරත්න මහත්මිය අතට පත් කිරීමෙන් අරමුදලේ දියත්කිරීම ඇරඹිණ. මෙම උත්සවයට ආරාධිත අමුත්තෝ විශාල පිරිසක් මහකොමසාරිස් කාර්‍යාල යට එදා රැස්ව සිටියහ.

මෙම **අපි වෙනුවෙන් අපි** අරමුදලේ මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ දැන් ආබාධිතව සිටින අපේ රණවිරුවන් සඳහා තනාගෙන යනු ලබන විශාල නිවාස ව්‍යාපෘතියකට මුදල් සම්පාදනය කර ගැන්මයි. මේ සඳහා එක්සත් රාජධානියෙන් පවුම් ලක්ෂයක් එකතුකර ගැන්ම ඉලක්කය වී ඇත. මේ කර්තව්‍යයට ආධාර පිණිස ලබන සැප්තැම්බර් මස සංගීතමය සහ සංස්කෘතික සංදර්ශණ තුනක් ලන්ඩනය, බර්මිංහැම් සහ මැන්චෙස්ටර් යන නගරවල පවත්වන්නට නියමිතව ඇත. මෙම සංදර්ශනයන් සඳහා සහ භාගිවන්නේ ශ්‍රීලංකාවේ ත්‍රිවිධ හමුදාවේ ප්‍රවීන ශිල්පීන්ය.

මෙම නිවාස ව්‍යාපෘතියේ ප්‍රථම අදියර ලෙස දැනට නිවාස **1620** ක් අනුරාධපුරයේ ඉපලෝගම නිමවෙමින් පවතී. එක්සත් රාජධානියෙන් එකතු කරන්නට බලාපොරොත්තුවන මුදලින් දෙවන නිවාස සංඛ්‍යාව සාදා නිමකරන්නට බලාපොරොත්තුවන්නේ හොරොව් පතානේය. පාසැල්, කඩ සාප්පු, සහ වෙනත් අවශ්‍ය පහසුකම් සහිතව මෙම නිවාස ව්‍යාපෘතිය ඉදිවෙනවා ඇත. පවුලකට පදිංචියකට සුදුසු මෙම එක් නිවසක් තනන්නට රුපියල් **11, 500** ක් වැයවන බව ගණන් බලා තිබේ.

මෙම අරමුදලේ මුදල් සියල්ල පාලනය වන්නේ ආරක්ෂක අමාත්‍යංශයෙනි.

**අපි වෙනුවෙන් අපි** අරමුදලට දෙන ආධාර මුදල් තැන්පත්කිරීම සඳහා බැංකු ගිණුමක් දැන් අරඹා ඇත.

ගිණුමේ නම **Api Wenuwen Api**
**HSBC A/c No: 3 1 6 7 6 1 2 1**
**Branch Sort Code 40 - 05 - 19**
චෙක්පතක් යවන්නේ නම් ලිපිනය
**Defence Adviser,**
**Sri Lanka High Commission,**
**13 Hyde Park Gardens**
**London W2 2LU.**

**www.apiwenuwenapi.co.uk**
**www.defence.lk**




**ඉරිදා**- දැන් ලන්ඩන්වල ගෙවල් හදන රෙපයාර් කරන
**SUN** වැඩ හුඟක් කරන්නෙ නැගණහිර යුරෝපෙන් ඇවිත් ඉන්න මිනිස්සු. සර්බියාව, බොස්නියාව, ක්‍රොඒෂියාව වගේ රටවලින් ආපු බාස්ලා. උන්ට ඉංග්‍රීසි තේරෙන්නෙත් නැහැ. හැම එකටම ඔළුව වනලා ඉයස් කියනවා. රන්ජිත්ලගෙ ගෙදර රෙපයාර් වැඩ වගයක් සුද්දන්ට වැඩිය ලාබය කියලා බොස්නියන් කාරයෙකුට දීලා. රන්ජිත් හවස ගෙදර එනකොට බාස් ගෙදර ජනේලයක් ගලවලා වෙන බිත්තියක හයි කරලා. මොකද කියලා ඇහුවම ඇයි මට කිව්වෙ එතන හයිකරන්න කියලා, බාස් කිව්වලු. රන්ජිත් මැන්ව අයින් කරලා අයිරිෂ් බාස් කෙනෙකුට වැඩේ බාරදීලා. ඒ අයිරිෂ් බාස් විනාඩි පහෙන් පහට පබ් එකට දුවනවලු බීලා එන්න. මාස තුනකට වැඩියි තවම ගෙදර වැඩේ ඉවර නෑ. ඔන්න ඔහොමයි මක බාස්ලා.

**සඳුදා** - ඉන්දියාවෙ හින්දු පත්තරේ තිබුනලු කරුණානිධි
**MON** දැන් බයේ ඉන්නවයි කොටි වැඩක් දේවිය කියලා. ඉස්සර කොටින්ව වර්ණනා කරපු, උන්ට සුදුහුණු ගාපු කරුණානිධි මෙකක්ද හේතුවකින් ළඟදි ඉඳල කොටින්ට බනින් පටන්ගත්තා. කරුණානිධිට ආරක්ෂාව වැඩි කරලයි කියලා තිබුණා. කොටින්ට බැන්නා කියන්නෙ නයාට ගහලා පොල්ල වරද්දගත්ත වගේ වැඩක්. රජීව් ගාන්ධිත් මරපු කොටින්ට කරුණානිධි කවුද?

**කුජදා** - ආතර් මාම ටෙලිපෝන් කරපු වෙලාවෙ කිව්වා
**TUE** දැන් ලංකාවෙ ඉස්සරට වැඩිය භූත දෝස තියනවයි කියලා. පහුගිය අවුරුදු විස්ස අතුළත නොසැහෙන්න භූතයො වැඩිවෙලයි කිව්වා. මේ ළඟදි කුරුණෑගල පැත්තෙ එක ගෙදරක ඉන්න සේරමදෙනාගෙ කොණ්ඩ රෑට නිදාගත්තම භූතයෙක් ඇවිත් කපනවලු. මං කිව්වා එහෙම නම් ඒ මැරිච්ච බාබර් කෙනෙක් වෙන්න ඇති කියලා. මාම කියනවා විහිළු නොවෙයිලු ඇඳන් ඉන්න ඇඳුම් පවා කපනවලු. මං කිව්වා එහෙනම් බාබර් විතරක් නෙවෙයි මැන් කලින් ටේලර් රස්සාවත් කරන්න ඇති කියලා. මාම තරහෙන් ටෙලිපෝන් එක තිබ්බා.

**බුදදා**- ගිය උතුරු නැගණහිර ජන්දෙට පස්සෙ එස්. බී.
**WED** දිසානායක කියලා තිබුණා යූ ඇන් පී එක එයාට ජන්ද කැම්පේන් එක බාරදුන්න නම් අගේට දිනවලා දෙනවයි කියලා. කොහොමද එහෙම කරන්නෙ. එයා ළඟ කවුරුවත් නොදන්න විශේෂ හැකියාවක් තියනවද? ඒ ඉස්සර ඒවා කළේ මැරවර බලයෙන්. හිරෙත් ගිහිං ආපු එස්.බී.ට දැන් තියන විශේෂ හැකියාව මොකක්ද? දිනවීම කොහොම වුනත් යූ ඇන්පියට ලැබෙන්න තියන ජන්ද ටිකත් එස්බී හන්ද නැතිවේවිය කියලා සෝමතුංග බාප්ප කියනවා. එයා හදන්නෙ රනිල් කපලා එතනට එන්නය කියලත් බාප්ප කිව්වා.

**ගුරුදා** - දැන් ආයිත් නෝර්වේකාරයො ලංකාවෙ ප්‍රශ්
**THU** නෙට අතදාන්න එනව වගේ පේනවා. ලංකාවෙ සාම කාක්කො කියනවා කොහොම හරි නෝර්වේ කස්ටිය ආයිත් ඇතුළට ගන්න කියලා. ඒ කියන්නෙ මේ කපපු ඉනිටික ආයිත් ගහට දාන්න කියලා. සාම කාක්කන්ට නෝර්වේ අත දිගඇරලා සලකන බව අපි කවුරුත් දන්නවා. එළවපු නෝර්වේකාරයා ආයිත් වැද්දගන්නෙ මොකටද? මට මතක් වෙනවා ඉස්සර ගමේ කුස්සියෙ ඉන්න හැල ගෙම්බො අල්ලලා එළියට වීසි කෙරුවම උන් වැටෙන්නෙ ආයිත් කුස්සිය පැත් බලාගෙන. නෝර්වේත් ඒවගේ ගස්ගෙම්බො ජාතියක්.

**කිවිදා** - දැන් මේ ළඟදි යූ ඇන් පී කස්ටිය කරත්තවල
**FRI** නැගලා කොළඹ වටේ ගියා තෙල්මිළ වැඩිකිරීමට විරෝධය පාන්න. එදා පැය ගණනක් ඒ හින්දම කොළඹ අවහිර වුණා. දවස ගාණෙ බෝම්බ පුපුරණ රටක පාරවල් අවහිරයක් නැතුව තියෙන්න ඕනෑ ලෙඩෙක් තුවාලකාරයෙක් ඉක්මනට ඉස්පිරිතාලෙට ගෙනියන්න. ඒ අවහිරේ හන්ද තව තව තෙල් එදා පිච්චුණා. ඒවගේ විගඩම් වැඩ මේ දේශපාලකයො කරන්නෙ. ඒත් තවම යූඇන්පියට කටඇරලා කියන්න බැරිවුණා කොටි ත්‍රස්තවාදය නැතිකළ යුතුයි කියලා. වෙන රටවල විපක්ෂ රට අන්තරායට වැටුණම රට ගැන හිතනවා. අපේ විපක්ෂය බරකරත්ත ගෙනැත් පාරට දාලා ඒවට පූයර බබාලා ටිකකුත් නග්ගගෙන ටිකක් කැගගහ ඉඳලා හතිවැටුණම ජීප් වල පැජරෝ වල නැගලා ගෙදර යනවා. ඔන්න දැන් දේශපාලනේ.

**ශනිදා**- දැන් ලංකාවෙ ඇරලා තියනවා ඇමරිකාව එංග-
**SAT** ලන්තෙ ප්‍රංශෙ ඉතාලිය ජර්මණිය ඔය ආදී ලෝකෙ ඕනම රටකට යන්න ක්‍රමය හරිගස්සලා දෙන ආයතන එක තැනක් තියනවා ඇඹුල් දෙනියෙ පරණ සමූපකාරයක කැල්ලක. අනේ අපේ මිනිස්සු රට යන්න තියන ආසාවට දෙපාරක් හිතන්නෙ නැතුව එතෙන්ට සල්ලි දෙනවා. ඒ සල්ලි දීපු කිසි කෙනෙක් කොහේවත් ගිහිං නැහැ. දැන් සමූපකාරෙත් වහලා. ඒකෙ හිටි ඇයො ගැන ආරංචියක්වත් නෑ. මං හිතුව අපේ මිනිස්සුන්ට දැන් මොළේ පෑදිලා ඇති කියලා. අපෝ නෑ.